දෙපාර්තමේන්තු චක්‍රලේඛ 05/2025

මගේ අංකය: DAPH/AD/16/02/06
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2025.05. 28

1. පළාත් ප්‍රධාන ලේකම් මගින්,
   පළාත් විෂයභාර අමාත්‍යාංශ ලේකම් මගින්,
   සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් ( සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) මගින්,
   දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරි,
   ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරි,
   නාගරික පශු වෛද්‍ය නිලධාරින්,
   පශු වෛද්‍ය නිලධාරින්

2. අධ්‍යක්ෂ ජනරාල් සෞඛ්‍ය සේවා මගින්,
   අධ්‍යක්ෂ (පශු මහජන සෞඛ්‍ය ) මගින්,
   මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරින්

3. අධ්‍යක්ෂ ජනරාල් (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) මගින්,
   අධ්‍යක්ෂ (වනජීවී) මගින්,
   වනජීවී පශු වෛද්‍ය නිලධාරින්

4. අධ්‍යක්ෂ ජනරාල් ( ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ) මගින්,
   අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය හා පෝෂණ ) මගින්,
   සත්වෝද්‍යාන පශු වෛද්‍ය නිලධාරින්

5. පශු මහජන සෞඛ්‍ය විශේෂඥ (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) මගින්,
   පශු විමර්ශන නිලධාරින්

<u>විධිමත් පශු මහජන සෞඛ්‍ය සේවාවන් ස්ථාපිත කිරීම</u>

සත්ත්ව රෝග මැඩපවත්වා ගැනීමටත්, සතුන්ගෙන් මිනිසුන්ට බෝවන රෝග මැඩපවත්වා ගැනීම හා පාලනය කිරීමටත්, සත්ත්ව නිෂ්පාදන මගින් ලෙඩරෝග පැතිරීම වැළැක්වීම හා සත්ත්ව නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිතභාවය පවත්වා ගෙන යාමට අවශ්‍ය පශු මහජන සෞඛ්‍ය පවත්වාගෙන යාම සඳහා පහත උපදෙස් ක්‍රියාත්මක කිරීම, 1992 අංක 29 දරන සත්ත්ව රෝග පනතේ මා වෙත පැවරී ඇති බලතල හා පළාත් පාලන චක්‍රලේඛ සංග්‍රහයේ 2007 අංක 03 පරිච්ඡේදය (කාර්ය මණ්ඩල කළමනාකරණය ) අනුව මෙයින් දන්වමි.

1. **පළාත් මට්ටමින් පශු මහජන සෞඛ්‍ය ඒකක පිහිටුවීම හා ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.**

1.1. සත්ත්ව රෝග වැළැක්වීම හා පශු මහජන සෞඛ්‍ය ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව සෞඛ්‍ය අංශය (පශු මහජන සෞඛ්‍ය විශේෂඥ) ගේ ප්‍රධානත්වයෙන්, අධ්‍යක්ෂ (පශු මහජන සෞඛ්‍ය), සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන සම්බන්ධීකරණයෙන් පළාත් පශු මහජන සෞඛ්‍ය ඒකක පිහිටුවා ගත යුතු වේ.

1.2. පළාත් පාලන ආයතනයට අදාල දිස්ත්‍රික්කයේ සේවය කරන එක් පශු වෛද්‍ය නිලධාරියෙක් "දිස්ත්‍රික් පශු මහජන සෞඛ්‍ය නිලධාරී" ලෙස දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණය කළ යුතුවේ.

2. **මහ නගර සභා කාර්යභාරය**

ප්‍රධාන මහ නගර සභා බල ප්‍රදේශ සඳහා වගකීම් දරන නාගරික පශු මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යභාරයන්ට අමතරව හා නගර සභා හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වල කාර්යභාරය සඳහා අදාල කොට්ඨාශය භාර පශු වෛද්‍ය නිලධාරියා වගකිව යුතුවේ.

2.1. මහනගර සභා සීමාවන් තුළ රාජකාරි කරන නාගරික පශු වෛද්‍ය නිලධාරීන් ඉහත සඳහන් කාර්යයන් සඳහා තම තමන් විසින් වගකීම් දරන ප්‍රදේශ වල රාජකාරී ඉටුකළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවලදී කොට්ඨාශ භාර පශු වෛද්‍ය නිලධාරියා සමඟ එක්ව කටයුතු කළ යුතුය.

2.2. එක් එක් දිස්ත්‍රික්කය යටතේ පවතින පශු වෛද්‍ය කොට්ඨාශ වල එක් පශු වෛද්‍ය නිලධාරියෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් සේවය කරන කොට්ඨාශ වල එක් පශු වෛද්‍ය නිලධාරියෙක් අදාල පළාත් පාලන ආයතනය වෙත "පශු මහජන සෞඛ්‍ය නිලධාරියා" ලෙස කටයුතු කිරීමට අනුයුක්ත කළ යුතුය.

2.3. එක් පශු වෛද්‍ය නිලධාරියෙකු පමණක් සේවය කරන ප්‍රාදේශීය පශු වෛද්‍ය කොට්ඨාශ වල, අදාල නිලධාරියා අනෙකුත් කටයුතු වලට අමතරව පළාත් පාලන ආයතනයට අදාල "පශු මහජන සෞඛ්‍ය නිලධාරියා" ලෙස රාජකාරි ආවරණය කිරීමට පළාත් අධ්‍යක්ෂවරයා විසින් කටයුතු සම්පාදනය කළ යුතුය.

3. **පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු මහජන සෞඛ්‍ය නිලධාරියාගේ කාර්යභාරය.**

3.1 මෙම කාර්යය කිරීම සඳහා අදාල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කොට්ඨාශ භාර පශු වෛද්‍යවරයා, පළාත් පාලන චක්‍රලේඛ සංග්‍රහයේ 2007 අංක 03 පරිච්ඡේදය (කාර්ය මණ්ඩල කළමනාකරණය ) අනුව නෛතිකව බලගැන්වේ.

3.2 සතුන්ගෙන් මිනිසාට බෝවන රෝග ( උදා : ජලභීතිකාව, ක්ෂය රෝගය, ගව ගබසාව,ලෙප්ටොස්පයිරා රෝගය ආදිය...) වාර්තාකරණය ( ප්‍රධාන කාර්යාලය වෙත ) හා රෝග වළක්වා ගැනීමට රෝග පාලන සැලසුම් අනුව ක්‍රියාත්මක විය යුතුවේ.

3.3 මෙම රෝගී තත්ත්වයන් පාලනය කරගැනීම සඳහා එන්නත්කරණය අවශ්‍ය වන අවස්ථාවලදී, අදාල රෝග මර්ධන වැඩ සටහන සඳහා එන්නත්කරණ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුවේ.

3.4 අදාල පළාත් පාලන ආයතනයේ පිහිටි ගව ඝාතකාගාර වලදී ඝාතනය වන සතුන්ගේ පූර්ව මරණ පරීක්ෂණ හා පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර සතුන්ගේ රෝගී තත්ත්වයන් නොමැති බවට තහවුරු කිරීම කළ යුතුවේ.

3.5 අදාල ඝාතකාගාර, මස් ගබඩා කරන ස්ථාන සහ මස් සකස් කරන ස්ථාන වල අපද්‍රව්‍ය මනාව කළමනාකරණය කරමින් සතුන්ගෙන් බෝවිය හැකි රෝග තවදුරටත් පැතිරීම වැළැක්වීම කළයුතු වේ.

3.6 සත්ත්ව නිෂ්පාදන වල තත්ත්වයන්ට බලපාන ප්‍රතිජීවක ඖෂධ භාවිතය හා ප්‍රතිජීවක ප්‍රතිරෝධකතාවය පිළිබඳව පශු විමර්ශන නිලධාරීන් විසින් සිදුකරන ආවේක්ෂණ සඳහා සහාය ලබාදීම කළයුතු වේ.

3.7 අදාල ගොවිපලවල් හා ඝාතකාගාර නෛතිකව ගෝඝාතක පනත යටතේ ලියාපදිංචි කිරීම හා ගොවිපලවල් හා ඝාතකාගාර සම්මත තත්ත්වයන් යටතේ පවත්වාගෙන යාම කළයුතු වේ.

3.8 පශු මහජන සෞඛ්‍යයට අදාල ලෙඩ රෝග වලට අදාලව තම ප්‍රදේශය සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම කළයුතු වේ.

3.9 සත්ත්ව සුභසාධනය පවත්වාගෙන යාම හා පරිසර හානි අවම කිරීමට කටයුතු කිරීම කළයුතු වේ.

3.10 අවශ්‍ය සෑම අවස්ථාවකදීම සෞඛ්‍ය අමාත්‍යාංශය හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ සහයෝගීව කටයුතු කිරීම කළයුතු වේ.

4. වනජීවී/ සත්වෝද්‍යාන පශු වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය.

4.1 වනජීවීන්ට අදාල සතුන්ගෙන් හා සත්වෝද්‍යාන වල ඇතිකරන සතුන්ගෙන් මිනිසාට බෝවන රෝග වැළැක්වීම සඳහා කටයුතු කිරීම කළයුතු වේ.

5. පශු විමර්ශන මධ්‍යස්ථානවල කාර්යභාරය.

5.1 සෑම පශු විමර්ශන මධ්‍යස්ථානයකම පශු මහජන සෞඛ්‍ය සේවාවට අදාල ආවේක්ෂණ හා රසායනාගාර සේවා සඳහා පශු වෛද්‍ය නිලධාරියකු සේවය කරනු ලැබේ.

5.2 අදාල නිලධාරීන්, සතුන්ගෙන් මිනිසාට බෝවන ලෙඩරෝග ඇතිවීම පාලනය කිරීමට, වසංගත විමර්ශනය කිරීමට කොට්ඨාශ භාර පශු වෛද්‍ය නිලධාරීන්ට සහාය විය යුතුය.

5.3 අපනයනය සඳහා ලියාපදිංචි වී ඇති ගොවිපල වල ( කුකුල්, සූකර,එළු හා ගව ආදී..) නිෂ්පාදනය කරන සත්ත්ව නිෂ්පාදන අපනයනයට සුදුසු තත්ත්වයක පවතීද යන්න සම්බන්ධයෙන් සය මාසික අවේක්ෂණ

සිදුකිරීම හා අදාල සාම්පල ලබාගෙන පරීක්ෂණ කිරීම හෝ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයට යොමු කිරීම සිදුකළ යුතුය.

5.4 වසංගත රෝගයක් පැතිරයාමේදී තම දිස්ත්‍රික්කයට අදාල වසංගතවේදී විමර්ශන සිදුකිරීම (රෝගයේ මූලාරම්භය, පැතිරීම, බලපාන ලද සාධක ආදී ) පශු විමර්ශන නිලධාරියාගේ වගකීම වේ.

5.5 සතුන්ගේ වසංගත රෝගී තත්ත්වයකදී පූර්ව මරණ පරීක්ෂණ හා පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකිරීම හා අදාල පරීක්ෂණ හෝ සාම්පල පශු වෛද්‍ය පර්යේෂණාගාරය වෙත යොමුකිරීම හෝ පශු විමර්ශන මධ්‍යස්ථානවල පවතින පහසුකම් අනුව පරීක්ෂා කිරීම පශු විමර්ශන නිලධාරියාගේ වගකීම වේ.

5.6 සත්ත්ව නිෂ්පාදන වල ඇතිවිය හැකි ප්‍රතිජීවක ප්‍රතිරෝධතාවය හා ඝන ලෝහ වැනි තත්ත්වයන් පිළිබඳ ආවේක්ෂණ සිදුකිරීම සඳහා පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය සමඟ එක්ව කටයුතු කළයුතු වේ.

5.7 අදාල ලෙඩරෝග තත්ත්වයන් සම්බන්ධයෙන් තම දිස්ත්‍රික්කයට අදාලව වසංගත රෝග වාර්තා ඉදිරිපත් කිරීම, නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම පශු විමර්ශන නිලධාරියාගේ වගකීම වේ.

## 6. රසායනාගාර පරීක්ෂාව.

6.1 ලංකාවේ සතුන්ට වැළඳෙන ලෙඩරෝග තහවුරු කිරීම සඳහා බලයලත් රසායනාගාරය ලෙස පශු වෛද්‍ය පර්යේෂණායතනය නම් කර ඇත. අවශ්‍ය විටකදී ලෝක සෞඛ්‍ය සංවිධානය යටතේ ක්‍රියාත්මක වන වෙනත් අන්තර්ජාතික රසායනාගාර වලට පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය මගින් සාම්පල යවා තහවුරු කිරීමක් කළ යුතුවේ.

6.2 සතුන්ට වැළඳෙන ලෙඩරෝග තහවුරු කරගැනීම සඳහා දැනට තෝරාගත් පශු විමර්ශන මධ්‍යස්ථාන වල විශේෂිත වූ පරීක්ෂණ පහසුකම් ස්ථාපිත කර ඇති අතර එම පරීක්ෂණ පහසුකම් වල යෝග්‍යතාවය පිළිබඳව පශු වෛද්‍ය පර්යේෂණායතනය මගින් ශක්‍යතා පරීක්ෂණ (Proficiency Testing) සිදුකර ගත යුතු වේ. ඒ අනුව එම මධ්‍යස්ථාන මගින් සේවා ලබාදීමට බලය ලබාදී ඇති අතර ඒවායින් ලබාගන්නා පරීක්ෂණ ප්‍රතිඵල තවදුරටත් තහවුරු කරගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පශු වෛද්‍ය පර්යේෂණායතනය වෙත යොමුකර තහවුරු කරගත යුතුය. සතුන්ට වැළඳෙන ලෙඩරෝග තහවුරු කරගැනීම සම්බන්ධ ප්‍රතිඵල සම්බන්ධයෙන් අවසන් වශයෙන් තහවුරු කිරීමේ බලය පශු වෛද්‍ය පර්යේෂණායතනය සතුවේ.

6.3 වසංගත රෝග අවස්ථාවල සියලුම සාම්පල අදාල දිස්ත්‍රික් පශු විමර්ශන මධ්‍යස්ථාන මගින් පශු වෛද්‍ය පර්යේෂණායතනයේ මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථාන වෙත ලබා ගත යුතු වේ.

## 7. ගොවිපල, ඝාතකාගාර, සැකසුම් මධ්‍යස්ථාන හා තොග ගබඩාකරණ ස්ථාන ලියාපදිංචිය.

7.1 සත්ත්ව ගොවිපල ( කුකුල්, ශූකර,එළු හා ගව ආදී..), ඝාතකාගාර, සැකසුම් මධ්‍යස්ථාන හා ගබඩාකරණ ස්ථාන වලින් ඇතිවන පරිසර හානි වළක්වා ගැනීම, ජෛව ආරක්ෂණ ක්‍රමවේද තීව්‍ර කිරීම, එම ගොවිපල් වලින් නිෂ්පාදනය වන නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීම හා ලෙඩරෝග බෝවීමට

ඇති අවස්ථා අවම කිරීම සඳහා එක් එක් ගොවිපල් පද්ධති වල හා අගය එකතු කරන දාමයේ පවත්වා ගත යුතු සම්මත තත්ත්වයන් පිළිබඳව දෙපාර්තමේන්තුව සකස් කරන නියාමනයන්ට අනුකූලව ලියාපදිංචි කිරීම හා ගොවිපල වර්ගීකරණය කිරීම සිදුකළ යුතු වේ.

7.2 සම්මත තත්ත්වයන් නොමැති ගොවිපල් හා අගය එකතු කරන දාමයේ එක් එක් අවස්ථාවල කිසියම් කාල පරිච්ඡේදයක් ඇතුළත අවම සම්මත තත්ත්වයන් කරා ළඟාකරගැනීම සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීම මගින් තත්ත්වයන් උසස් කිරීම අවශ්‍ය වේ.

7.3 ඝාතකාගාර හා මස්, කිරි, බිත්තර හා වෙනත් සත්ත්ව නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන හා ගබඩාකරණ මධ්‍යස්ථාන සම්මත තත්ත්ව යටතේ ලියාපදිංචි කිරීම සිදුකළ යුතු වේ.

ඉහත තත්ත්වයන් පවත්වා ගැනීම තුළින් සතුන්ගෙන් මිනිසාට බෝවිය හැකි රෝග අවම කිරීම හා ලෙඩ රෝග සඳහා වැයවන මහජන මුදල් අවම කිරීමත්, අදාල සේවාවන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම මගින්, සත්ත්ව නිෂ්පාදන වල සෞඛ්‍ය තත්ත්වය ගොවිපල තුළදීම තහවුරු කිරීම හා අපනයන පහසුකරණය මෙම චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණ වන අතර, අදාල පාර්ශව මේ අනුව කටයුතු කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.

Hemal Abey

ආචාර්ය කේ.ඒ.සී.එච්. ඒ කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | :- කාරු.දැ.ගැ.ස. |
| 02. | විගණකාධිපති | :- කාරු.දැ.ගැ.ස. |
| 03. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කාරු. දැ.ගැ.ස. |
| 04. | අධ්‍යක්ෂ ( සත්ත්ව සෞඛ්‍ය/සත්ත්ව අභිජනන/පශු අණ පනත් හා නීති/ පශු පර්යේෂණ/ පශු සම්පත් සැලසුම් හා ආර්ථික/ මානව සම්පත් සංවර්ධන/පරිපාලන)(සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කාරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 05. | නාගරික කොමසාරිස් (කොළඹ/මොරටුව/කඩුවෙල/දෙහිවල ගල්කිස්ස/ මීගමුව/ ගම්පහ/ මහනුවර) | :- කාරු. දැ.ගැ.ස. |
| 06. | ප්‍රධාන ගණකාධිකාරි/ ප්‍රධාන අභ්‍යන්තර විගණක (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කාරු. දැ.ගැ.ස. |
| 07. | ඉංජිනේරු(සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කාරු. දැ.ගැ.ස. |
| 08. | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී (අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය) | :- කාරු. දැ.ගැ.ස. |